# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2483/14 - 2026 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා - 2026.04.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍ය, වෛද්‍ය එච්. එම්. සුසිල් රණසිංහ වන මම, එකී මණ්ඩලයට, මීපිලිමාන ජල යෝජනා ක්‍රමයේ “මීහිඳුපුර” ජල ගබඩා ටැංකිය ඉදිකර ඇති ඉඩම් කොටස අත්කර ගැනීමට අවශ්‍යාව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වෛද්‍ය එච්. එම්. සුසිල් රණසිංහ,**
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය.

යොමු අංකය : MHC&/WS/LA/02/569.
2026 මාර්තු මස 31 වැනි දින,
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය,
2 වන මහල, සෙත්සිරිපාය අදියර 1,
බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 476 G, මීහිඳුපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මීහිඳුපුර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද අවසාන කැ. මැ. මු. පි. 53 බී අතිරේක අංක 04හි කැබලි 203න් කොටසක් වන පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 4.5 ක් පමණ වන ඉඩම් කොටස :

**මායිම් :**

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස |
| *දකුණට* | : | පාර (කැබලි අංක 43) |
| *බටහිරට* | : | කැබලි අංක 202 |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය*

1. එස්. වී. හේමන්ත සුභාවික්‍රම මහතා,
   නො. 145,
   මිහිඳුපුර,
   මීපිළිමාන.

EOG 04 - 0055

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.